මණ්ඩලීය චක්‍රලේඛ අංක :වා01 /2023

මගේ අංකය : වාණිජ/සසා(බිල් කිරීම්)/NC
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
රත්මලාන
2023-01-10

**සියළුම අතිරේක සාමාන්‍යාධිකාරීවරුන්,**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්,**
**සහකාර සාමාන්‍යාධිකාරීවරුන්,**
**මණ්ඩලයේ ලේකම්,**
**කළමනාකරුවන්/ ප්‍රධාන ඉංජිනේරුවරුන්,**
**ප්‍රධාන ගණකාධිකාරීවරුන්/ ප්‍රධාන ප්‍රමාණ සමීක්ෂක,**
**ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්/ වාණිජ නිලධාරීවරුන්,**
**රසඥ/ සමාජ විද්‍යාඥවරුන්/ වැඩභාර නිලධාරීන්,**
**ඇතුළු අනෙකුත් අංශ ප්‍රධානීන්,**

**ඇස්තමේන්තු සංශෝධනය කිරීම - ජල සම්බන්ධන ලබා දීමේදී ප්‍රාග්ධන වියදම් පියවා ගැනීම, නව ජල සම්බන්ධන තැන්පත් හා වාරික ගෙවීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් 12.10.2012 දිනැතිව නිකුත් කරන ලද මණ්ඩලීය චක්‍රලේඛ, මෙමඟින් සංශෝධනය කරමි.

මේ සමඟ ඉදිරිපත් කරනු ලබන ක්‍රමවේදය අනුව පරිච්ඡේද අංක 1 – 9 දක්වා උපයෝගී කරගෙන අදාල ප්‍රභේදයට අනුකූලව 17.01.2023 දින සිට නව ජල සම්බන්ධන ඇස්තමේන්තු සකස් කල යුතුවේ.

ඇස්තමේන්තු ගාස්තු සඳහා ඇතුලත් විය යුත්තේ,

1. ජල සම්බන්ධන ගාස්තු 20mm සහ 25mm (NC Charges for 20mm and 25mm).
2. ප්‍රාග්ධන වියදම් පියවීමේ ගාස්තු (CRC).
3. ප්‍රාග්ධන සංවර්ධන ගාස්තු (CDC).
4. නව ජල සම්බන්ධන තැන්පත්( Deposits).
5. පොදු ජල කරාම ඉවත් කිරීම සඳහා නව ජල සම්බන්ධන ගාස්තු 20mm සහ 25mm. (Removing Stand posts)
6. රජයේ පාසැල්, ආගමික ස්ථාන සහ රජයේ අනුමත පුණ්‍යායතන සඳහා ජල සම්බන්ධන ගාස්තු. ( Government School and Religious & Government Approved Charitable Premises)
7. පොදු ජල නල එලීම සඳහා වන ගාස්තු ගණනය කිරීම ( Common Main)
8. නව ජල සම්බන්ධන වාරික ගෙවීම් ( New Connection Installments)
9. රජයේ බදු අය කිරීම ( Government Taxes)

ඉහත ගාස්තු වලට අමතරව විශේෂ අවස්ථාවන් හිදී හැර, වෙනත් කිසිදු ගාස්තුවක් අය නොකළ යුතු අතර මෙමඟින් ඉහත කරුණු වලට අදාලව ජල සම්බන්ධන ගාස්තු සම්බන්ධව මීට පෙර නිකුත් කල සියළු චක්‍රලේඛ අවලංගු වනු ඇත.

වැ. බ. සාමාන්‍යාධිකාරී

පිටපත් :

1. සභාපති
2. උප සභාපති
3. ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන්

1. නව ජලසම්බන්ධන ගාස්තු විශ්කම්භය මි.මි. 20 සහ මි.මි. 25

1.1. ප්‍රධාන නළයේ සිට ජලසම්බන්ධන මණුව දක්වා දුර ප්‍රමාණය මීටර 0-25 අතර

මෙහි දක්වා ඇති ගාස්තු විශ්කම්භය 25 mm දක්වා පමනක් වේ. විශ්කම්භය 25 mm වඩා වැඩි ජලසම්බන්ධන සඳහා අදාල මණ්ඩලීය මිල ගණන් පොතට අනුකූලව ගාස්තු සකස් කල යුතුවේ.

වගුව I.1. - නව ජලසම්බන්ධන ගාස්තුව (දුර ප්‍රමාණය මීටර 0 සිට 25 දක්වා)

| ජලසම්බන්ධනයේ විශ්කම්භය | ජලසම්බන්ධනයේ විශ්කම්භය | |
|---|---|---|
| | 20mm | 25 mm |
| ප්‍රධාන නළයේ සිට ජල සම්බන්ධන මණුව දක්වා සේවා නලයේ දුර 10m තෙක් ගාස්තුව (රුපියල්) | 24,500/- | 31,500/- |
| ප්‍රධාන නළයේ සිට ජල සම්බන්ධන මණුව දක්වා සේවා නලයේ දුර 10m ට වඩා වැඩි වු විට සහ 25m දක්වා ගාස්තුව (රුපියල්) | 31,200/- | 38,700/- |
| සමෘද්ධි සහ පොදු ජල කරාම ඉවත් කර නව ජලසම්බන්ධන ලබා දීමේ ගාස්තුව 25m දක්වා (රුපියල්) | 10,900/- | අදාල නොවේ (20 mm පමණි) |

සටහන:

a. සමෘද්ධි සහ පොදු ජල කරාම ඉවත් කර නව ජලසම්බන්ධන ලබා දීමේදී හැර ඉහත මිල ගණන් වල කානු කැපීම සහ වැසීම, අවශ්‍ය නල සහ උපාංග සැපයීම, නල එළීම හා ජල නල වැද්දුම් වැඩ, නැවත කානු වැසීමේ ගාස්තු සහ පොදු කාර්යය පිරිවැය (OVER HEAD) ඇතුලත් වේ.

b. සමෘද්ධි සහ පොදු ජල කරාම ඉවත් කර නව ජල සම්බන්ධන ලබා දීමේදී කානු කැපීම හා වැසීම සඳහා වන ගාස්තුව ඉහත වගුව 1.1හි ඇතුලත් නොවන අතර එය අයදුම්කරු විසින් සිදු කල යුතු වේ. එසේ නොකරන්නේ නම් මීටර් 10ක් දක්වා වු දුර සඳහා රුපියල් 5,300/- ක් සහ මීටර් 10 සිට මීටර් 25 දක්වා වු දුර සඳහා පළමු මීටර් 10 ට අදාල දුර සඳහා නියමිත රුපියල් 5,300/-ක මුදලට අමතරව තවත් රුපියල් 6,500/- ක්ද වශයෙන් අතිරේකව අය කල යුතුවේ.

c. සමෘද්ධි සහ පොදු ජල කරාම ඉවත් කර නව ජලසම්බන්ධන ලබා දීමේදී හැර කානු කැපීම හා නැවත වැසීම (Pit එක හැර ) අයදුම්කරු විසින් සිදු කරන්නේ මීටර් 10ක් දක්වා වු දුර සඳහා රුපියල් 5,300/- ක් සහ මීටර් 10 සිට මීටර් 25 දක්වා වු දුර සඳහා පළමු මීටර් 10 ට අදාල දුර සඳහා නියමිත රුපියල් 5,300/-ක මුදලට අමතරව තවත් රුපියල් 6,500/- ක්ද වශයෙන් ඇස්තමේන්තුවෙන් අඩු කල යුතුවේ.

d. කානු කැපීම හා නැවත වැසීම (Pit එක හැර) අයදුම්කරු විසින් සිදු කරන්නේ නම් මණ්ඩලයේ පිරිවිතරයන්ට අනුකූලව එය සිදු කල යුතුය.

e. කළුගල් කැඩීම හෝ වෙනත් විශේෂ අවස්ථාවන් සඳහා ඉහත මිල ගණන් වලට අමතරව මණ්ඩලයේ පවතින මිල ගණන් පොතට අනුකූලව අතිරේකව ගාස්තු සකස් කර අය කල යුතු වේ.

f. මාර්ග කැණීම් සඳහා වන ගාස්තු අදාල ආයතනය වෙත ගෙවීම් කර අවසරය ලබා ගැනීම අයදුම්කරු විසින් කල යුතුය.

**1.2.** ප්‍රධාන නළයේ සිට ජලසම්බන්ධන මණුව දක්වා දුර ප්‍රමාණය මීටර් 25 ට වඩා වැඩි විට ඉහත වගුව 1.1. ට අමතරව පහත ගාස්තු ගෙවීම් කල යුතුය.

**වගුව I. 2. - අතිරේක ගාස්තුව (දුර ප්‍රමාණය මීටර 25ට වැඩි)**

| ජල සම්බන්ධන විශ්කම්භය | සෑම අමතර මීටර් 25 කට අය කල යුතු ගාස්තුව (රු.) (කානු කැපීම සහ වැසීම ඇතුලත් නොවේ ) |
|---|---|
| 20 mm | 5,000.00 |
| 25 mm | 5,700.00 |

සටහන:

a. මෙහි අදාල ජල නල සහ උපාංග සපයා එලීම සඳහා වැය වන මුදල සහ පොදු කාර්යය පිරිවැය පමණක් ඇතුලත් වන අතර, මෙවා මීටර් 50, මීටර් 75 සහ මීටර් 100, මීටර් 125, මීටර් 150 අනුව ගණනය කළ යුතුවේ.

b. මෙහිදි කානු කැපීම සහ වැසීම අයදුම්කරු විසින් සිදු කළ යුතු වේ. එසේ නොකරන්නේ නම් පළමු මීටර් 25ට නියමිත මුදලට අමතරව අතිරේක සෑම මීටර් 25කටම රු. 11,800/- ක් වශයෙන් අතිරේකව අය කල යුතුවේ.

2. ප්‍රාග්ධන වියදම් පියවීමේ ගාස්තු (CRC)

වගුව **2.1** - ප්‍රාග්ධන වියදම් පියවීමේ ගාස්තු (CRC)

| ප්‍රභේදය | ජල සම්බන්ධන විශ්කම්භය (mm) | මහ නගර සභා සීමාව (රු.) | ප්‍රාදේශිය සභා / නගර සභා සීමාව (රු.) |
|---|---|---|---|
| Domestic ගෘහමය | 20 | 10,000.00 | 5,000.00 |
| | 25 | 15,000.00 | 10,000.00 |
| Non Domestic ගෘහ නොවන | 20 | 15,000.00 | 10,000.00 |
| | 25 | 20,000.00 | 15,000.00 |
| | 32 | 50,000.00 | 50,000.00 |
| | 50 | 110,000.00 | 110,000.00 |
| | 63 | 190,000.00 | 190,000.00 |
| | 90 | 430,000.00 | 430,000.00 |
| | 110 | 760,000.00 | 760,000.00 |
| | 160 | 1,800,000.00 | 1,800,000.00 |
| | 225 | 3,120,000.00 | 3,120,000.00 |
| | 280 | 4,800,000.00 | 4,800,000.00 |

සටහන -

- සමෘද්ධි හා පොදු ජල කරාම ඉවත් කර මීටර **150** සීමාව ඇතුලත නව ජල සම්බන්ධන ලබාදීමේදී **CRC** අය නොකල යුතුය.

3. **ප්‍රාග්ධන සංවර්ධන ගාස්තු (CDC)**

**3.1. ප්‍රාග්ධන සංවර්ධන ගාස්තු (CDC) ගනනය කිරීම.**

රජයේ පාසල් , ආගමික ස්ථාන හා රජයේ අනුමත පුණ්‍ය ආයතන හැර දෛනික ඇස්තමේන්තු ජල පරිභෝජනය ඝණ මීටර 5ට වැඩි ස්ථානවලට ජලය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් සහ දේපළ සංවර්ධන ආයතන විසින් සංවර්ධනය කර විකුනනු ලබන ඉඩම් කට්ටි සඳහා බෙදා හැරීම් නල පද්ධතියක් එලීමට ඉල්ලා සිටින විට ප්‍රාග්ධන සංවර්ධන ගාස්තු (CDC) ගෙවිය යුතු වේ.

**වගුව III - ප්‍රාග්ධන සංවර්ධන ගාස්තු (CDC)**

| ඇස්තමේන්තු ජල පරිභෝජනය ඝණ මීටර්/ දිනකට | ප්‍රාග්ධන සංවර්ධන ගාස්තු (රු.) |
|---|---:|
| 05 ට අඩු | 0 |
| 06-10 | 60,000.00 |
| 11-25 | 150,000.00 |
| 26-50 | 300,000.00 |
| 51-75 | 450,000.00 |
| 76-100 | 550,000.00 |
| 101-200 | 1,100,000.00 |
| 201-300 | 1,650,000.00 |
| 301-400 | 2,200,000.00 |
| 401-500 | 2,750,000.00 |
| 501-1,000 | 2,750,000.00 |
| 1,001-2,000 | 5,500,000.00 |
| 2,001-3,000 | 11,000,000.00 |
| 3,001-4,000 | 16,500,000.00 |
| 4,001-4,500 | 22,000,000.00 |
| >4,500 | 25,000,000.00 |

**3.2** ප්‍රාග්ධන සංවර්ධන ගාස්තු (CDC) ගණනය කිරීම සඳහා දිනකට ජල පරිභෝජනය ඇස්තමේන්තු කිරීමේදී පහත සඳහන් කරුණු වලින් වැඩි ජල පරිමාවේ අගය සලකනු ලැබේ.

a. ඇස්තමේන්තු මුළු පරිමාව දිනකට නිවසක් (Per House) හෝ ඉඩම් කට්ටියක් (Block Of Land) සඳහා ලීටර් 1,000ක් වශයෙන් සැලකිය යුතුය.

b. ඇස්තමේන්තු මුළු පරිමාව දිනකට ගණනය කිරීමේදී, ආරෝග්‍යශාලා සඳහා ඇඳකට ලීටර් 500ක්ද , හෝටලයක් (නාන තටාක සහිත) සඳහා කාමරයකට ලීටර් 1,000ක්ද, හෝටලයක් (නාන තටාක රහිත) සඳහා කාමරයකට ලීටර් 500ක්ද, කාර්යාලයක් සඳහා වර්ගඵලය වර්ග මීටර 1 සඳහා ලීටර් 5ක් ද වශයෙන් ගණනය කල යුතුය.

c. කර්මාන්තශාලා සඳහා හෝ ඉහත කරුණු වලට අමතරව වෙනත් ඕනෑම අවස්ථාවකදී ඒවායේ ස්වභාවයට අනුව අවස්ථානුකූලව ක්‍රියා කල යුතුවේ.

d. තවද ඉල්ලුම්කරු විසින් දිනකට ඉල්ලුම් කරනු ලබන ජල ප්‍රමාණය ඉහත ගණනය කිරීම් වලට වඩා වැඩි නම් ප්‍රාග්ධන සංවර්ධන ගාස්තු (CDC) ගණනය කිරීමේදී එම අගය ගත යුතුවේ.

**4. නව ජල සම්බන්ධන තැන්පත් (නැවත ගෙවනු ලබන)**

**4.1 වගුව IV - නව ජල සම්බන්ධන තැන්පත් (නැවත ගෙවනු ලබන)**

| ගෘහමය | | ගෘහමය නොවන | |
|---|---|---|---|
| **20mm dia.** | **25mm dia.** | **20mm dia.** | **25mm dia.** |
| 1,500.00 | 3,000.00 | 3,000.00 | 6,000.00 |

**4.2** ඉහත වගුව IV හි ඇතුලත් තැන්පතු මුදලට අමතරව ඉදිකිරීම් සිදු කිරීමට යෝජිත පරිශ්‍ර සඳහා (උදා: හිස් ඉඩම් හෝ අර්ධ ඉදිකිරීමක්) නව ජල සැපයුමක් සඳහා අයදුම් කිරීමේදී පහත සඳහන් පරිදි නැවත ගෙවනු ලබන අතිරේක තැන්පත් මුදලක් ගෙවිය යුතු වේ.

a. 25mm දක්වා ගෘහ ප්‍රභේදයන් සඳහා - රු. 5,000.00

b. 25mm දක්වා ගෘහ නොවන ප්‍රභේදයන් සඳහා - රු. 10,000.00

c. ඉහත 25 mm වැඩි ජලසම්බන්ධන සඳහා හෝ වැඩි පරිභෝජනය පවතින ස්ථාන පිළිබඳව වෙන් වෙන් වශයෙන් ගණනය කළ යුතුවේ.

d. රජයේ පාසල් , ආගමික ස්ථාන සහ රජයේ අනුමත පුණ්‍ය ආයතන මෙයට ඇතුලත් නොවේ.

e. ඉදිකිරීම් අවසන් වීමෙන් පසු මෙම තැන්පත් මුදල නිදහස් කෙරේ.

**4.3 තාවකාලික ජල සම්බන්ධනයක් සඳහා වු තැන්පත් මුදල්**

තාවකාලික ජල සම්බන්ධනයක් යනු හිමිකරුගේ කැමත්ත මත (උදා-කොන්ත්‍රාත් පිරිනැමීමක්) යම් සංවර්ධන කටයුත්තක් වෙනුවෙන් තෙවන පාර්ශවයක් විසින් (උදා-කොන්ත්‍රාත්කරු) ඉල්ලුම් කරනු ලබන ජල සම්බන්ධනයක් වේ.

a. තැන්පත් මුදල (20 mm ජල සම්බන්ධනයකට) - රු. 50,000.00

b. තැන්පත් මුදල (25 mm ජල සම්බන්ධනයකට) - රු. 75,000.00

c. ඉහත 25 mm වැඩි ජලසම්බන්ධන සඳහා හෝ වැඩි පරිභෝජනය පවතින ස්ථාන පිළිබඳව මෙය වෙන් වෙන් වශයෙන් ගණනය කළ යුතුවේ.

**5. පොදු ජල කරාම ඉවත් කර නව ජල සම්බන්ධන ලබ දීම**

a. පොදු ජල කරාමයේ සිට මීටර් 150 ඇතුලත සහ පොළවේ වර්ගඵලය වර්ග අඩි 1,000 නොඉක්මවන නිවාසයක් විය යුතුය.

b. එසේම ඉවත් කරනු ලබන පොදු ජල කරාමය භාවිතා කරන ලද නිවසක් විය යුතුය.

c. පොදු ජල කරාමයට අදාල ගිණුමෙහි මෙතී අයදුම්කරුට අදාල හිඟ මුදල් කොටස නිරවුල් කල යුතුය.

d. එසේ කල නොහැකි අවස්ථාවකදී අදාල හිඟ මුදල් කොටස අයදුම්කරුගේ නව ගිණුමට එකතු කල යුතුය.

**6. රජයේ පාසැල් සහ ආගමික ස්ථාන හා රජයේ අනුමත පුනාය ආයතන සඳහා නව ජලසම්බන්ධන ගාස්තු**

**a.** ගෘහ පදනමට නව ජලසම්බන්ධන ගාස්තු අය කල යුතුය.

**b.** 20mm සහ 25mm ජල සම්බන්ධන වලට පමණක් ප්‍රාග්ධන වියදම් පියවීමේ ගාස්තු (CRC) අදාල නොවේ.

c. ප්‍රාග්ධන සංවර්ධන ගාස්තු (CDC) අදාල නොවේ.

**d.** ජල සම්බන්ධනය ලබා දීමට අලුතින් පොදු නලයක් එළිමට ඇත්නම් හැර දැනට එලා අවසන්ව ඇති පොදු ජල නලයකින් නව සම්බන්ධතාවයක් ලබා දීමේදී පොදු ජල නල ගාස්තු සම්බන්ධයෙන් මෙහි පරිච්ඡේද 07- C හි සඳහන්ව ඇති අය කිරීම කල යුතු නොවේ.

**7. පොදු ජල නල එළිම සඳහා වන ගාස්තු ගණනය කිරිම**

a. පොදු ජල නලයක් යනු මීටර් 500කින් කෙලවර වන නල මාර්ගයකි. ( මීටර 500 ඉක්මවයි නම් එය ජල නල දිර්ග කිරිමක් ලෙස සැලකිය යුතුය.)

b. පොදු ජල නලයක් එළිම සඳහා අවම වශයෙන් නිවාස ඒකක/ ඉඩම් කැබලි / ඉල්ලුම්කරුවන් තුන්දෙනෙකු ගෙන් සමන්විය යුතුය.

c. කාණු කැපීම හා වැසීම ඉල්ලුම්කරුවන් විසින් සිදු කල යුතු අතර එසේ නොකරන්නේ නම් "වගුව V" සඳහන් පරිදි ඒ සඳහා අතිරේක මුදලක් අය කල යුතු වේ.

d. එලීමට නියමිත එම පොදු ජල නලයෙන් දැනට ජල සම්බන්ධන ඉල්ලා ඇති අයදුම්කරුවන් පොදු ජල නළය ආරම්භක ස්ථානයෙහි සිට එම අයදුම්කරුවගේ පරිශ්‍රයට අදාල ස්ථානයට ඇති දුර ප්‍රමාණයට අනුව මෙම පොදු නල ගාස්තුව පහත වගුව V සඳහන් පරිදි ගෙවීම් කල යුතු වේ. **මෙලෙස අය කල යුතු උපරිම දුර ප්‍රමාණය මීටර් 150ක් වේ. තවද දැනට එලන ලද පොදු ජල නලයෙන් නව ජල සම්බන්ධතා ලබාගැනීමේදී ඒ සඳහා පොදු ජල නල ගාස්තුව අය නොකල යුතුය.**

වගුව V ( **මීටරයක් සඳහා ගාස්තුව**)

| නලයෙහි විශ්කම්භය | නල සහ උපාංග හා නල එලීම රු. | කානු කැපීම සහ වැසීම රු. |
|---|---|---|
| 63 mm හෝ 90mm (PE/PVC) | 450.00 | 700.00 |

e. පොදු ජල නලයක අවම විශ්කම්භය 63 mm වන අතර, පිහිටි නිවාස සංඛ්‍යාව අනුව හෝ ජල ඉල්ලුම මත ඊට වැඩි විශ්කම්භයක් යෙදිය හැක.

f. යම් හේතුවක් නිසා පොදු ජල නලය සඳහා වැඩි විශ්කම්භයකින් යුත් නළයක් යෙදුවහොත්, පොදු ජල නලයක් සඳහා අය කල යුතු වන්නේ 63 mm නලය සඳහා වූ මුදල පමණි.

g. මෙහිදි පොදු ජල නල එළීම සඳහා වන ගාස්තුව හෝ ප්‍රාග්ධන වියදම් පියවීමේ ගාස්තු (CRC) යන දෙකෙන් වැඩි ගණන පමණක් අය කල යුතුය.

**8. නව ජලසම්බන්ධන වාරික ගෙවීම්**

a. වාරික ගෙවීමේ පහසුකම ලබා දෙනුයේ හිමිකරුට පමණක් වන බැවින් වාරික ගෙවීම් පහසුකම ඉල්ලුම් කරන විට අයදුම්කරු විසින් තම හිමිකාරීත්වය සනාථ කල යුතුය.

b. නව ජලසම්බන්ධන සඳහා එකවර මුදල් ගෙවීමට අපහසු ඉල්ලුම්කරුවන් සඳහා, උපරිම වශයෙන් මාස 24 ක් දක්වා වාරික ලබා දිය හැක.

c. ඒ සඳහා 15% වාර්ශික පොලියක් අය කරනු ලැබේ.

d. මේ සඳහා මූලික ගෙවීම් පහත සඳහන් වගුව VI පරිදි වේ.

වගුව VI - වාරික ගෙවීම්

| නව ජලසම්බන්ධන ගාස්තු (රු.) | මූලික ගෙවීම |
|---|---|
| රුපියල් 40,000.00 දක්වා | 40% |
| රුපියල් 40,000.00 වැඩි | 30% හෝ රුපියල් 16,000.00 අවමයකට යටත්ව |

## 9. රජයේ බදු ගණනය කිරීම

a. ඒ ඒ කාල සීමාවන් අනුව රජය විසින් පනවනු ලබන බදු මුදල් අය කල යුතු වේ.